# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1964/68 - 2016 අප්‍රේල් මස 29 වැනි සිකුරාදා - 2016.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: BD/ST/LND/1/7/33.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 13/96/එච් ඩබ්/184.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

බදුල්ල කරමැටිය ආදා උල්පත මාර්ගයේ 14/9 බෝක්කුව ඉදිකිරීම සඳහා

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තරය* :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සොරණාතොට කෝරළේ, නාගොල්ලාගම ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ අවසාන ගම් පිඹුරු අංක 178, අතිරේක අංක 31 හි සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0868 ක් වන පහත උපලේඛනයේ විස්තර කර ඇති බිම් කැබලි:

**උපලේඛනය**

1. **කැබලි අංක 721**

ඉඩමේ නම: කොස්ගහකුඹුර; ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0538.

2. කැබලි අංක 722

ඉඩමේ නම: කොස්ගහකුඹුර; ඉඩම් පරිහරණය: මාර්ග (මහා මාර්ගය); හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0330.

පහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2016 ජුනි මස 29 වැනි දින ප.ව. 2.00 ට සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ජුනි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එච්. එම්. නන්දසේන,
ප්‍රාදේශීය ලේකම්,
සොරණාතොට,

2016 අප්‍රේල් මස 27 වැනි දින.
සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

05 - 431


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23376 - 18 - (2016/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.